1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/10/11 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.03. 22 |

<u>ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ 01/2023</u>

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,

ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,

දකුණු පළාත.

<u>කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් නිල රථ සඳහා ඉන්ධන සැපයීම හා ඒ සඳහා ගෙවීම් සිදු කිරීම</u>

දකුණු පළාත් සභාවේ නිල වාහන හිමිකම් ඇති රජයේ වාහන තම නිල වාහන ලෙස භාවිතා කරනු ලබන නිලධාරීන් වෙත වෙන් කර ඇති, කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත්, ටොයෝටා කොරොල්ලා 141 හා ටොයෝටා යාරිස් මෝටර් රථ සඳහා යොදනු ලබන ඉන්ධන සම්බන්ධව ක්‍රියාත්මක වූ ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 01/2013 මින් අවලංගු කරමි.

02. එම රථ මිළ දී ගෙන දැනට වසර 10කට ආසන්න කාලයක් ගත වන බැවින් හා රජයේ වියදම් කළමනාකරණ ප්‍රතිපත්තීන් අනුව වියදම් අවම කිරීම සඳහා, රථයේ අත්පොතෙහි සුපර් පෙට්‍රල් හෝ සුපර් ඩීසල් යොදාගන්නා ලෙස දක්වා ඇති අවස්ථා වල හැර 2023.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍ය පෙට්‍රල් භාවිතා කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

03. එමෙන්ම නිල රථ ලෙස භාවිතා කරන්නාවූ කැබ් රථ සඳහා ද සාමාන්‍ය ඩීසල් භාවිතා කරන ලෙසත්, ඒ අනුව මාසික ඉන්ධන දීමනා ලබා ගන්නා ලෙසත් තව දුරටත් දැනුම් දෙමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත:

ගණකාධිකාරී, ප්‍රධාන ලේකම් කාර්යාලය : මේ අනුව ගෙවීම් කටයුතු සඳහා


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"